# පොළොන්නරු යුගයෙහි දේශීය වෛද්‍ය ක්‍රමයේදී යොද ගන්නා ලද වෛද්‍ය උපකරණ හා විධි පිළිබඳ අධ්‍යයනයක්

කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ
දර්ශනපති (ආයුර්වේද) පශ්චාත් උපාධිය
සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධනය


## වෛද්‍ය එච්.එච්.පී. ජයවර්ධන

සහාය උපදේශක
මහාචාර්ය පී.එල්. ප්‍රේමතිලක
පුරාවිද්‍යා අධ්‍යක්ෂ-ආළාහන පරිවෙණ ව්‍යාපෘතිය
මධ්‍යම සංස්කෘතික අරමුදල
අතපත්තු ගොඩනැගිල්ල
නො. 11
නිදහස් මාවත
කොළඹ 07.

උපදේශක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආර්.එස්. ජයවර්ධන
මෞලික සිද්ධාන්ත අධ්‍යයනාංශය
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
රාජගිරිය

**මෞලික සිද්ධාන්ත අධ්‍යයනාංශය**
**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**
**රාජගිරිය**



2001 ජනවාරි

එම්පිල් / 96 / 43

# සාරාංශය

ක්‍රි.ව. 647 දී රජ වූ 4 වන අග්‍රබෝධි රජුගේ කාලයෙන් ආරම්භවී ක්‍රි.ව. 1279 දී රජවූ 4 වෙනි විජයබාහු රජුගේ අවසානය දක්වා පොළොන්නරු යුග කාල රාමුව මෙම අධ්‍යයනය සඳහා අදාල කර ගතිමි. මෙම කාලය තුළ පාලකයින් 19 දෙනෙක් පමණ බලයට පත්වූ අතර, 1 වන විජයබාහු, 1 වන පරාක්‍රමබාහු, කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල යන නරපතියන් මොවුන් අතරින් සුවිශේෂ කර්තව්‍යයක් සිදුකර ඇත. පොළොන්නරුව රාජකීය වශයෙන් හා ආගමික වශයෙන් මෙන්ම සංස්කෘතික හා කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි යොමුකරවූයේ ඉහත කී රජුන් තිදෙනා පමණි. ක්‍රි.ව. 1153-1186 දක්වා රජකළ 1 වන පරාක්‍රමබාහු සිය ගණනකට විසිය හැකි රෝහලක් කරවා දේශීය වෛද්‍ය ක්‍රමය දියුණු කල බව මහාවංශයේ සඳහන්ව ඇත.

පුරාණ ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය රාවණා කාලයේ සිට පැවතින. අර්ක ප්‍රකාශ, නාඩි ශාස්ත්‍ර, කුමාර තන්ත්‍ර, උඩිස් තන්ත්‍ර, යන වෛද්‍ය ග්‍රන්ථ විජය රජු එමට පෙරත් මෙහි තිබූ බව රාවණා පිළිබඳ ජනප්‍රවාදයන්ගෙන් පවා පැහැදිලි වේ. මෙලෙස ශ්‍රී ලංකාවේ එකල පැවති වෛද්‍ය විද්‍යාව හා ආර්යයන් විසින් ගෙන ආ වෛද්‍ය ශිල්ප ඥාණය සම්මිශ්‍රණය වීමෙන් ඉතා උසස් දේශීය වෛද්‍ය ක්‍රමයක් බිහිවිය. අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, ගම්පල, කුරුණෑගල, ආදී යුගයන්හි දේශීය වෙදකම දියුණුව පැවති බව ග්‍රන්ථ ගත තොරතුරු, සෙල්ලිපි තොරතුරු වලින් පැහැදිලිවේ. කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය ඇති වීමත් සමග සාහිත්‍ය, කලා ශිල්ප, මෙන්ම ආයුර්වේදය, ජ්‍යොතිෂය, ආදියේද දියුණුවක් ඇති විය. මහනුවර යුගයේදී පිරිහුණු ආයුර්වේදය කොළඹ යුගයේදී දියුණුවට පත්විය. ආයුර්වේද වෙදකම පරපුරෙන් පරපුරට උරුම වූ දයාදයක් වීම, ආයුර්වේදය දිගුකලක් තිස්සේ ආරක්ෂාවීමට හේතු විය. විද්‍යෝදය, විද්‍යාලංකාර, පිරිවෙන් ඇතිවීම නිසා ඒ තුළින් දේශීය වෙදකම පිරිවෙන් විෂයක් වශයෙන් පාඨමාලාවට ඇතුලත් විය. 1926 දී ඇතිකල ස්වදේශීය වෛද්‍ය විද්‍යාලය 1977 විශ්ව විද්‍යාල තත්වයට පත් කරන ලදී.

පොළොන්නරු යුගය තුල පැවති දේශීය වෙදකම පිළිබඳව ග්‍රන්ථ, සෙල්ලිපි හා පුරාවිද්‍යා කැණීම් වලින් පැහැදිලි වෙයි. පැරණි රජ දරුවන් විසින් පිහිටවන ලද රෝහල්, බෙහෙත් ශාලා ගැන මහාවංශයෙහි නොයෙක් තැන්හි සඳහන් කර ඇත. අනුරාධපුරයෙහි පණ්ඩුකාභය රජ විසින් සෞඛ්‍ය සංරක්ෂණ කටයුතු කල ආකාරයත්, ගර්භිණීන් සඳහා රෝහල් සෑදූ බවත්, සඳහන් වේ. එක් එක් යුගයන්හි දේශීය වෛද්‍ය ක්‍රමයට රජවරුන් කල කාර්යයන් පිළිබඳ ග්‍රන්ථ ගත තොරතුරු වලින් මනාව අවබෝධ වේ.

කුකුරුමහන්දමන ටැම් ලිපිය, කිරිබත් වෙහෙර ටැම් ලිපිය, දෙරබාවිල ටැම් ලිපිය, මිහින්තලේ පුවරු ලිපිය, කොළඹ කෞතුකාගාර ටැම් ලිපිය, පිවන්දියාව සෙල්ලිපිය, මගුල්මහා විහාර සෙල්ලිපිය, රාජාංගනේ සෙල්ලිපිය, මැදිරිගිරිය පර්වත ලිපිය, පොළොන්නරුව රාජසභා මණ්ඩප ටැම් ලිපිය, ආදියෙන් වෛද්‍ය මය තොරතුරු රැසක් හෙළිවේ.

පැරණි රෝහල් වල නටබුන්, බෙහෙත් ඔරු වල නටබුන්, ජන්තාඝර වල නටබුන්, සෙල්ලිපි නටබුන් ආදියෙන් ද දියුණු වෛද්‍ය ක්‍රමයක් පැවති බව පිළිගත හැකිය. පොළොන්නරු යුගය තුල භාවිත වූ දේශීය වෛද්‍ය උපකරණ ලෙස ශල්‍ය කතුරු, ශල්‍ය අඬු, ශල්‍ය පිහියා, ශලාකාවන්, විදුම් පිලිස්සුම් උපකරණ, කිරුම් මිනුම් උපකරණ, හැඳි, බරණි, ඖෂධ සකස්කිරීමට යොදගත් උපකරණ, අත්ගල්, ඇඹරුම් ගල්, සඳුන් ගල්, මැටි තැටිය, බෙහෙත් ඔරු, කෙණ්ඩි, ආදිය දැක්විය හැක. මේ කාලය තුළ ශල්‍ය වෛද්‍ය ක්‍රම, මනෝ වෛද්‍ය ක්‍රම, වෙදහල්, ඖෂධ ශාලා හා ඔසු උයන්, ඇදහිලි ක්‍රම, සෞඛ්‍ය සංරක්ෂණ විධි, පරිසර සංරක්ෂණ විධි, පශු වෛද්‍ය ක්‍රම, දියුණු වූ ජලාපවහන ක්‍රම දියුණුව පැවතී ඇත.